**ශ්‍රී ලංකා රග්බි - 2019**

**------------------------**

## 1.1 මතය වියාචනය

**------------------**

ශ්‍රී ලංකා රග්බි 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ශ්‍රී ලංකා රග්බි මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.2 මතය වියාචනය සඳහා පදනම

**----------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ විගණන විෂය පථය සම්බන්ධයෙන් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ශ්‍රී ලංකා රග්බි අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ශ්‍රී ලංකා රග්බි ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ශ්‍රී ලංකා රග්බිහි අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ශ්‍රී ලංකා රග්බිහි මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා රග්බි වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව ශ්‍රී ලංකා රග්බි මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2016 වර්ෂයේ පැවති ජාත්‍යන්තර රග්බි තරඟාවලියට සහභාගිවීමට ජාතික පාසල් කණ්ඩායම් සඳහා ශ්‍රී ලංකා රග්බි විසින් වැයකරන ලද එකතුව රු.17,492,313 ක් ශ්‍රී ලංකා පාසල් රග්බි ෆුට්බෝල් සංගමයෙන් ලැබිය යුතු ලෙස දක්වා ඇත. එසේ වුවත් එම ශේෂය අයකර ගැනිමේ අවිනිශ්චිතතාවය හේතුවෙන් ඒ සඳහා මූල්‍ය ප්‍රකාශනවල වෙන්කිරීමක් සිදුකර නොතිබුණි. | මීළඟ මූල්‍ය වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම. |

### 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| | රු. | | | |
| (අ) ලැබිය යුතු ගිණුම් | 573,550 | ශේෂ සනාථන | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | වත්කම් හා වගකීම් සනාථ කර ගැනීමට අවශ්‍ය ප්‍රමාණවත් හා යෝග්‍ය විගණන සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වීම. |
| (ආ) ගෙවිය යුතු ගිණුම් | 14,202,445 | ශේෂ සනාථන | | |
| (ඇ) අනෙකුත් අත්තිකාරම් | 133,408 | උපලේඛන සහ කාල විශ්ලේෂණ | | |

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට වර්ෂ 6 කට වැඩි කාලයක් හිඟහිටි රු.133,408 ක ලැබිය යුතු ශේෂය සහ වර්ෂ 04 කට වැඩිකාලයක් හිඟහිටි රු.5,441 ක වෙනත් ලැබිය යුතු ශේෂයක්ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ලැබිය යුතු ශේෂයන් අයකර ගැනිම සඳහා කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතු වීම. විධායක කමිටුවේ අනුමැතිය මත අයකර ගත නොහැකි ශේෂයන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

### 1.6.2 ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 03 කට වැඩි කාලයක් පැවති එකතුව රු.3,261,885 ක් වූ ගෙවිය යුතු ශේෂ 05 ක් සහ වර්ෂ 02 කට වැඩි කාලයක් පැවති රු.8,707,829 ක් වූ ගෙවිය යුතු ශේෂ 18 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ගෙවිය යුතු ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කිරීම හෝ තවදුරටත් එම ශේෂයන් නිරවුල් කිරීමට බැදීමක් නොමැතිනම් එම ශේෂයන් ලියාහැර ආදායමට ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 1.7 නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග 7 (xii) | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස්කර වර්ෂය ආරම්භවීමට මාස 03 කට පෙර අනුමැතිය සඳහා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මීළඟ මූල්‍ය වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ජාතික ක්‍රීඩා සංගම් නියෝග පරිදි කටයුතු කළ යුතු වීම. |
| (ආ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය | 2019 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2020 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ. | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.4,860,940 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.28,672,002 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.23,811,062 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ආදායම රු.11,049,549 කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපෙක්ෂව සමාලෝචිත වර්ෂයේදී ජංගම අනුපාතය 0.68 සිට 0.57 දක්වා අඩු වී තිබුණි. ඒ අනුව ශ්‍රී ලංකා රග්බි හි කෙටි කාලීන බැරකම් පියවීමේ හැකියාව ඉකුත් වර්ෂයට සාපෙක්ෂව පරිහී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා රග්බි ව්‍යවස්ථාවේ 14.1 (ඒ) හා (ඕ) වගන්තිවලට අනුව, ජාතික පාසල් හා පළාත් පාසල්, රග්බි පාපන්දු සංගමය, ශ්‍රී ලංකා රග්බි පාපන්දු තරඟ තීරක සංගමය හා ශ්‍රී ලංකා පළාත් රග්බි පාපන්දු සමාජ ඇතුලු ශ්‍රී ලංකා රග්බි සාමාජිකයන් විසින් එක් එක් මූල්‍ය වර්ෂය අවසන් වී දින 45 ක් ඇතුළත වරලත් ගණකාධිකාරීවරයෙකු විසින් සහතික කරන ලද තම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. තවද, නිල බලයෙන් පත්වූ සියලු නිලධාරීන්ගේ සහ කමිටු සාමාජිකයන්ගේ ජීව දත්ත, කමිටු සටහන්වල සහතික කළ පිටපත් අදාළ මහා සභා රැස්වීමේ පැමිණීමේ ලේඛන, විගණිත මූල්‍ය ප්‍රකාශනවල සහතික කළ පිටපත් ඇතුලු අනෙකුත් ලේඛන සහ එම විගණිත මූල්‍ය ප්‍රකාශන ඔවුන්ගේ මහා සභා රැස්වීමේදී සැලකිල්ලට ගත් බව තහවුරු කිරීම සහ සාමාජිකයින්ගේ ලැයිස්තු සහ තරඟ හා වෙනත් වැඩසටහන් පිළිබඳ විස්තරද ශ්‍රී ලංකා රග්බි වාර්ෂික මහා සභා රැස්වීම් දිනයට මාසයකට පෙර ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද, මෙම අවශ්‍යතාවයන් සඳහා අනුකූලවීමට ශ්‍රී ලංකා රග්බි විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 2020 වර්ෂයේදී මෙම කරුණු නිරාකරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ශ්‍රී ලංකා රග්බි ව්‍යවස්ථාව ප්‍රකාරව කඩිනම් පියවර ගත යුතු වීම. |

| | | |
|---|---|---|
| (ආ) 2017 වර්ෂයේදි ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා රග්බි වෙත, මිළඟ වසර පහ සඳහා උපායමාර්ගික සැලැස්මක් සංවර්ධනය සඳහා රු.770,000 ක් ලබාදී තිබුණි. රු.816,326 ක මුදලකට සැලැස්ම සකස්කිරීම සඳහා ශ්‍රී ලංකා රග්බි විසින් පෞද්ගලික ආයතනයක් තෝරාගෙන තිබුණු අතර ඒ සඳහා රු.385,000 ක අත්තිකාරම් මුදලක්ද ගෙවා තිබුණි. කෙසේ වෙතත් 2020 ජූලි වන විටත් එම සැලැස්ම ලැබී නොතිබුණි. | 2020 වර්ෂයේදී නිරාකරණය කිරීමට කටයුතු කරනු ලැබේ. | උපායමාර්ගික සැලැස්ම පිළියෙල කිරීමට කඩිනම් පියවර ගත යුතු වීම. |
| (ඇ) 2019 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.6,333,533 ක් වූ ස්ථාවර වත්කම් සඳහා වාර්ෂික භෞතික සත්‍යාපනයක් සිදුකර නොතිබුණි. | මිළඟ මූල්‍ය වර්ෂයේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ස්ථාවර වත්කම් භෞතික සත්‍යාපනයක් කිරීමට කටයුතු කළ යුතු වීම. |